# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2026.03.16 පැය 0745 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/449/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ පනත ප්‍රකාරව සැකකාරියක් අත්අඩංගුවට - නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය.**

2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුල දකුණු ඉන්දියාවේ සිට මෙරටට මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කල පුද්ගලයෙකු එමගින් උපයා ගන්නා ලද මුදලින් දෙමහල් නිවසක්, කඩකාමර 05 කින් යුත් නිවසක්, මෝටර් රථයක් හා රන් පවුම් 360 කට ආසන්න රන් ආභරණ ප්‍රමාණයක් උපයා ගෙන ඉන් රන් භාණ්ඩ උකස් කර පසුව විකුණා ඇති බවට ලද පැමිණිල්ලක් මත නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය මඟින් විමර්ශනයක් ආරම්භ කර තිබුණි.

මෙම පැමිණිල්ලට අදාල සැකකරු අත්අඩංගුවට ගැනීමෙන් පසු ඉහත නිවාස 02 හා මෝටර් රථය සම්බන්ධයෙන් මන්නාරම ගරු මහාධිකරණයේ නඩු පවරා ක්‍රියාවිරහිත කිරීමේ නියෝග ලබා ගෙන එම නියෝග තහවුරු කර දීර්ඝ කිරීම් සිදු කරමින් පවතී.

මෙම රන් භාණ්ඩ සම්බන්ධයෙන් සිදුකරන ලද දීර්ඝ විමර්ශනයේදී ඉහත සැකකරුගේ බිරිඳගේ මව විසින් මූල්‍ය ආයතන කිහිපයක රන් භාණ්ඩ උකස් කර පසුව මන්නාරම ප්‍රදේශයේ රන් භාණ්ඩ අලෙවිසැල් කිහිපයකට එම රන් භාණ්ඩ විකිණීම් සිදුකර ඇති බවට විමර්ශනයේදී අනාවරණය වි ඇත.

ඒ අනුව ඉහත සැකකරු විසින් නීති විරෝධී ක්‍රියාකාරකම් මගින් උපයාගන්නා ලද රන් භාණ්ඩ බව දනිමින්ම උකස් කිරීම හා විකිණීම සිදු කරමින් මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ පනත ප්‍රකාරව ගැනෙන වරදවල් සිදුකිරීම සම්බන්ධයෙන් ආධාර අනුබල දීමට අදාලව ඉහත සැකකරුගේ බිරිඳගේ මව 2026.03.15 දින සවස් කාලයේ මන්නාරම දී අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකාරිය වයස අවුරුදු 66 ක් වන මන්නාරම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය මඟින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**